සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභා
චක්‍රලේඛ ලිපි අංක 01/2025

මගේ අංකය PPSC/ES/14/FI/02/28
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලය
සබරගමුව පළාත් සභාව
නවනගරය,රත්නපුර
2025.01. 03

ලේකම්
පළාත් මාර්ග සංවර්ධන,ග්‍රාමීය යටිතල පහසුකම්,
සංචාරක,ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණිය සඳහා (සීමිත බඳවා ගැනීම) අයදුම්පත් කැඳවීම -2025**

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.11.11 දින අනුමත කර ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරින් සඳහා වන බඳවා ගැනීම් පරිපාටියට අනුව ප්‍රධාන ලේකම්ගේ අංක DCSPT/05/P2/Rec.com හා 2024.08.26 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි, සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරින්ගේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව පහත සුදුසුකම්ලත්, සබරගමුව පළාත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දැනට සක්‍රීය සේවයේ සිටින ක්‍රීඩා නිලධාරින්ගෙන් මින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම සීමිත බඳවා ගැනීම් සිදු කිරීම සඳහා ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/ES/06/10/1 හා 2024.11.20 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දී ඇත.

මෙම චක්‍රලේඛ ලිපිය පහත සුදුසුකම් සපුරන සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න. මෙම චක්‍රලේඛයේ හා අයදුම්පත්‍රයේ පිටපතක් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ (www.psc.sg.gov.lk) පළ කර ඇත.

- ක්‍රීඩා පුහුණුකරු තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාව :- 04
- මෙම තනතුරේ වැටුප් පරිමාණය:MN 3- 2016 වැටුප් කේත අංකය දරණ ශ්‍රේණි සඳහා
  රු. 31,040 – 10X445 – 11X660 – 10X730 – 10X750 – 57,550/-

**1.0** පළපුරුද්ද

1.1 සබරගමුව පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරි තනතුරේ වසර (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

**2.0** අයදුම්කිරීම සඳහා තිබිය යුතු වෘත්තිය සුදුසුකම්

2.1 ක්‍රීඩා පනත යටතේ අදාළ ක්‍රීඩා ක්ෂේත්‍රයට නියමිත ක්‍රීඩා පාලක මණ්ඩලය/සංගමය විසින් හෝ ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් නිකුත් කරන ලද පුහුණුකරුවකුගේ බලපත්‍රයක් ලබා තිබීම හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිගත් ආයතනයක් විසින් අදාළ ක්‍රීඩාව සඳහා පවත්වනු ලබන මාස 03 කට නොඅඩු පුහුණු පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම.

2.2 තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හය (06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබා තිබීම.

2.3 සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරින් සඳහා වන බඳවා ගැනීම් පරිපාටියෙහි ඇතුළත් ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවා ගැනීමට අදාළව 7.2.2.1 හි (අ) හෝ (ආ) යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

සංලක්ෂය: ක්‍රීඩා පුහුණුකරු තනතුරට බඳවා ගැනීමේ දී ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරන දිනට පෙර බඳවා ගන්නා ලද ක්‍රීඩා නිලධාරීන් සඳහා මෙහි 7.2.2.1හි සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් අදාළ නොවේ.

**3.0 සපුරාලිය යුතු වෙනත් සුදුසුකම්**

01. පත්වීම ස්ථිර කර තිබීම.

02. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

03. පූර්වාසන්න වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

04. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

05. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම සහ ක්‍රීඩා නිලධාරි තනතුරේ අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

06. අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළකරන දිනට සපුරා තිබිය යුතු බවට සඳහන් සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

## 4.0 සීමිත බඳවා ගැනීමේ ව්‍යුගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1.ජ්‍යෙෂ්ඨතාවය | සබරගමුව පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරි තනතුරට පත් වී වසර 10ක් සම්පූර්ණ කළ දින සිට සම්පූර්ණ එක් වසරකට ලකුණු 03 බැගින් | 30 | 30 | |
| 2.අතිරේක වෘත්තීය සුදුසුකම් | i.ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ,<br><br>ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳව හෝ පරිපාලනය පිළිබඳ උපාධිය - 25<br>මාස 3 කට වැඩි දේශිය/විදේශිය පාඨමාලාවක් සඳහා - 15<br>මාස 01 කට වැඩි දේශිය/විදේශිය පාඨමාලාවක් සඳහා - 10<br>සති දෙකකට වැඩි දේශිය/විදේශිය පාඨමාලාවක් සඳහා - 05<br>සති එකට වැඩි දේශිය/විදේශිය පාඨමාලාවක් සඳහා - 02 | 25 | 40 | |
| | ii. ජාතික මහා ක්‍රීඩා උළෙලකදී හෝ ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික සංගම් තරඟාවලියක අවසන් අදියරේ තරඟවල දී,<br>• පුහුණුකරුවකු වශයෙන් කටයුතු කිරීම - 10<br>• සහාය පුහුණුකරුවකු වශයෙන් කටයුතු කිරීම - 05<br>(සනාථ කිරීම සඳහා පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.) | 10 | | |
| | iii. ක්‍රීඩා තරඟ විනිශ්චයකරුවකු/තාක්ෂණික නිලධාරියකු වශයෙන් ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික විනිසුරු සංගමයක විනිසුරු බලපත්‍රයක් ලබා තිබීම (සනාථ කිරීම සඳහා ලිපි ලේඛන හා වාර්තාවල මුල්පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.) | 05 | | |
| 3.ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම පිළිබඳ අතිරේක පළපුරුද්ද හා දක්වන ලද කුසලතා | i. ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම නිසා ඔවුන් විසින් දිස්ත්‍රික් පළාත් හා ජාතික ක්‍රීඩා උළෙලකදී (රන්, රිදී, ලෝකඩ පදක්කම් පමණක් සැලකිල්ලට ගනු ලැබේ.) දක්වන ලද දක්ෂතා වෙනුවෙන් (සනාථ කිරීම සඳහා ලිපි ලේඛන වාර්තාවල සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.)<br>• පිළිගත් ජාත්‍යන්තර තරඟ නියෝජනය කිරීම - 15<br>• ජාතික තරඟ<br>1 වන ස්ථානය - 10<br>2 වන ස්ථානය - 7.5<br>3 වන ස්ථානය - 05<br>නියෝජනය - 03<br>• පළාත් තරඟ<br>1 වන ස්ථානය - 05<br>2 වන ස්ථානය - 03<br>3 වන ස්ථානය - 02<br>• දිස්ත්‍රික් තරඟ<br>1 වන ස්ථානය - 03<br>2 වන ස්ථානය - 02<br>3 වන ස්ථානය - 01<br><br>ii. ක්‍රීඩා පුහුණු සංචිතයක් පවත්වා ගෙන යාම - 05 | 20 | 20 | 40% |
| 4.අමතර සුදුසුකම් | i.ක්‍රීඩා පුහුණුකරු තනතුරේ වැඩ බැලීම/වැඩ ආවරණය කිරීම - 05<br>(විධිමත් පත්වීම් ලිපියක් තිබිය යුතු ය)<br>ii.ප්‍රශංසා සහතික සඳහා - 02<br>iii.දිස්ත්‍රික් සංගම්වල නිලතල දැරීම - 01 | 05 | 05 | |
| 5.සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | සන්නිවේදනය හා පෞරුෂය | 05 | 05 | |
| | මුළු ලකුණු | 100 | 100 | |

සටහන- "පිළිගත් ජාත්‍යන්තර තරග" යනුවෙන් අර්ථ ගන්වන්නේ ඔලිම්පික්,ලෝක ශූරතා,පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරග,ආසියානු තරගාවලි,ආසියානු කණිෂ්ඨ තරග,දකුණු ආසියානු තරගාවලි හා දකුණු ආසියානු කණිෂ්ඨ තරගාවලි ආදියයි.

## 5.0 අයදුම්කළ යුතු අන්දම

මෙහි සඳහන් ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කරගත් අයදුම්පත්‍රයක් සබරගමුව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ මගින් සබරගමුව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ ලේකම්ට ඉදිරිපත් කළ යුතු ය. ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් තමන්ට අයදුම්පත් ඉදිරිපත් වූ වහාම එකම ආවරණ ලිපියක් යටතේ එම අයදුම්පත් මෙම කොමිෂන් සභාව වෙත **2025.02.01** (මෙම දිනයට ජ්‍යෙෂ්ඨතාවය ඇතුළු අනෙකුත් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.) දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතු ය. (එම අයදුම්පතෙහි තොරතුරු පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර බලා අයදුම්පත් ආකෘතියේ අදාළ කරුණු සහතික කරමින් මෙම කාර්යාලයට එවිය යුතු ය.)

අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.0 සම්මුඛ පරීක්ෂණ දිනයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට අදාළ සියලු සහතික ඉදිරිපත් කළ යුතු වේ. **සම්මුඛ පරීක්ෂණ වේලාවෙන් පසුව සහතික පත්‍ර හෝ වෙනත් ලිපිලේඛන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා නොදෙන බවත්,** ඉදිරිපත් කරන සහතික සඳහා ලකුණු ලබා දීම බඳවා ගැනීම් පරිපාටියට අනුකූලව තීරණය කිරීම අදාළ **සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සතු** වන **බවත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන බවත් වැඩිදුරටත් දන්වමි.**

7.0 මෙම ක්‍රීඩා පුහුණුකරු බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මින් පෙර අවස්ථා දෙකකදී නව පරිපාටිය යටතේ පවත්වා ඇත. (2021.01.18 හා 2024.10.10) ඒ අනුව මේ වන විටත් මෙම නිලධාරීන්ගේ දැනගැනීම සඳහා අදාළ ලකුණු ප්‍රසිද්ධ කර ඇත.ඔබ සම්මුඛ පරීක්ෂණයට මුහුණදෙන ආකාරය අනුව අදාළ ලකුණු වෙනස් වීමේ හැකියාව පවතී.

8.0 සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ක්‍රීඩා නිලධාරීන්, ඉදිරිපත් කරන එකම සහතික සඳහා නැවත නැවත ලකුණු ලබා දී ඇති බැවින් 2024.10.10 පසුව මෙම ක්‍රීඩා නිලධාරීන්ගේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දක්වන දක්ෂතා හා සහතික කෙරේ වැඩි අවධානයක් යොමු කෙරේ.

9.0 ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම පිළිබඳ අතිරේක පළපුරුද්ද හා දක්වන ලද කුසලතා යටතේ ඔබගේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ දී දක්වන දක්ෂතා සඳහා වැඩි අවධානය යොමු කෙරේ.

10.0 සමස්ත සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලිය අවසන් වී පත්වීම්ලබා දුන්පසුව සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි නිලධාරීන්ගේ සමස්ත ලකුණු ඔවුන්ගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලැබේ.

11.0 නියමිත සුදුසුකම් සපුරා ඇතැයි පෙනී යන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා වූ විභාග ප්‍රවේශපත්‍ර අයදුම්පත්‍රයේ සඳහන් කාර්යාලීය ලිපිනයට යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.මෙහි සඳහන්ව නොමැති කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

o/c

එස්.එම්.ඩී.සී.සමරසේකර
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පිටපත්
01.ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - කාරුණික දැනගැනීම සඳහා
02.පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ,ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව - අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට යොමු කිරීම සඳහා
ස.ප.ස